# එක්සත් ජාතික පක්ෂයේ ව්‍යවස්ථාව

2023.10.21

# පටුන

## පරිච්ඡේද


| | |
|---|---|
| 1 ව්‍යවස්ථාව | පක්ෂය |
| 2 ව්‍යවස්ථාව | පක්ෂයේ පරමාර්ථ |
| 3 ව්‍යවස්ථාව | පක්ෂ සාමාජිකත්වය |
| 4 ව්‍යවස්ථාව | පක්ෂ සංවිධානය |
| 5 ව්‍යවස්ථාව | පක්ෂ සම්මේලනය |
| | ජාතික විධායක කමිටුව |
| 7 ව්‍යවස්ථාව | පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය |
| 8 ව්‍යවස්ථාව | පක්ෂයේ නිලධාරීන් |
| 9 ව්‍යවස්ථාව | ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු සහ වෙනත් මැතිවරණ |
| 10 ව්‍යවස්ථාව | ස්ථාවර නියෝග |
| 11 ව්‍යවස්ථාව | ජාතික යොවුන් පෙරමුණ |
| 12 ව්‍යවස්ථාව | එක්සත් ලක් වනිතා පෙරමුණ |
| 13 ව්‍යවස්ථාව | එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම සහ එහි අරමුණු |
| 14 ව්‍යවස්ථාව | පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් |
| 15 ව්‍යවස්ථාව | චංචල හා නිශ්චල දේපල |
| 16 ව්‍යවස්ථාව | අන්තර්කාලීන හා සාමාන්‍ය විධි විධාන |


2 6 FEB 2024

## 01 වන පරිච්ඡේදය

## 01 වන ව්‍යවස්ථාව

### පක්ෂය

| | |
|---|---|
| නම | 1.1 ජාතිවාදී හෝ නිකායවාදී නොවන සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ඇප කැප වන පක්ෂය,<br>(අ) එක්සත් ජාතික පක්ෂය<br>(ආ) ඓක්‍ය දේශීය කච්චි<br>(ඇ) ද යුනයිටඩ් නැෂනල් පාටි (United National Party) යනුවෙන් හැඳින්විය යුතු ය. |
| සළකුණ සහ වර්ණය | 1.2 පක්ෂයේ සළකුණ අලියා ය. වර්ණය කොළ පාට ය. |

## 02 වන පරිච්ඡේදය

## 02 වන ව්‍යවස්ථාව

## පක්ෂයේ පරමාර්ථ

අරමුණ

2.1 ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ අනෙකුත් මැතිවරණයන් හි දී බලය ලබා ගැනීමේ අරමුණෙන් යුතුව පාර්ලිමේන්තුව තුළ සහ රට තුළ දේශපාලන පක්ෂයක් සංවිධානය කොට පවත්වා ගෙන යාම.

2.2 පක්ෂය විසින් අනුමත කරනු ලබන මූලධර්ම, ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2.3 සාමාන්‍යයෙන්. ජනතාවගේ දේශපාලන අධ්‍යාපනය වර්ධනය කිරීම සහ ඔවුන් දේශපාලන, සමාජමය, ආර්ථික සහ සංස්කෘතිමය අතින් උසස් තත්ත්වයකට පත් කිරීම, එමෙන් ම සර්වජන ඡන්ද බලය සහ ජනතාවගේ මූලික අයිතිවාසිකම් පිළිගනිමින් සමාන අයිතිවාසිකම් හා අවස්ථාවන් සෑම දෙනාට ලබා දීමට කටයුතු කිරීම.

## 03 වන පරිච්ඡේදය

## 03 වන ව්‍යවස්ථාව

## පක්ෂ සාමාජිකත්වය

**සුදුසුකම්**

3.1 පක්ෂ ව්‍යවස්ථාව සහ මෙම පරිච්ඡේදයෙහි සඳහන් සාමාජිකත්වය පිළිබඳ කොන්දේසි පිළිගන්නා පක්ෂයේ කෘත්‍යාධිකාරී කමිටුව මගින් නියම කරනු ලබන සහ වාර්ෂික සාමාජික මුදල ගෙවනු ලබන වයස අවුරුදු 15 ට නොඅඩු ඕනෑ ම අයෙකුට පක්ෂ සාමාජිකත්වය ලබාගත හැකිය. සාමාජිකත්වයට ඇතුළු වූ දින දොළොස් මසක කාලයකට සාමාජිකත්වය වලංගු වන අතර එය අවුරුදු පතා අලුත් කළ යුතු ය. යම් අයෙකුට සාමාජිකත්වය දැරිය හැක්කේ එක් කොට්ඨාශයක පිහිටි එක් ශාඛා සමිතියක පමණි.

**රීති සහ කාර්ය පටිපාටිය**

3.2 පක්ෂ සාමාජිකත්වයට අදාල සියලු ම කරුණු සම්බන්ධයෙන් රීති සහ කාර්ය පටිපාටිය පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියම කරනු ලැබිය යුතුය.

**සාමාජිකත්වයේ කොන්දේසි**

3.3 පක්ෂයේ සාමාජිකත්වය පිළිගන්නා ඕනෑ ම තැනැත්තෙකු පහත දැක්වෙන කරුණුවලට එකඟ විය යුතු ය.

(අ) පක්ෂයේ මූලධර්ම, දැක්ම, ප්‍රතිපත්ති, වැඩසටහන් සහ තීරණ පිළිගැනීම.

(ආ) පක්ෂය විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයින්ට හැකි සියලු ම සහයෝගය දීම සහ ඒ අපේක්ෂකයින්ට විරුද්ධව ඉදිරිපත් වන වෙනත් තැනැත්තන්ට කිසිදු සහයෝගයක් නොදීම.

පක්ෂයෙන් අපේක්ෂකයෙකු නාම යෝජනා කර නොමැති අවස්ථාවකදී සාමාජිකයින් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ බලය පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු අතර, එසේ කරනු ලබන විධාන සාමාජිකයන් විසින් පිළිපදිනු ලැබිය යුතු ය.

(ඇ) ඉහත සඳහන් එකඟතාවයන්ට ප්‍රතිවිරුද්ධ වන්නා වූ එසේ වීමට ඉඩ ඇති කිසිදු දේශපාලන හෝ වෙනත් ක්‍රියාකාරිත්වයකට සහාය නොවීම සහ පක්ෂය අපකීර්තියට පත් නොකිරීම.

විනය බලතල

3.4

(අ) සියලුම සාමාජිකයන් ව්‍යවස්ථාවට, රීතින්වලට, ස්ථාවර නියෝගවලට, පක්ෂයේ විනය රීති මාලාවට හා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණ සහ නියෝගවලට ගරු කළ යුතුය.

(ආ) කිසිදු සාමාජිකයෙක් විසින් තවත් සාමාජිකයෙකුට පරිභව කිරීම, අපහාස කිරීම, තර්ජනය කිරීම හෝ පහරදීම හෝ වෙනත් සාමාජිකයෙකු ප්‍රසිද්ධියේ විවේචනය කිරීම හෝ පක්ෂයේ ප්‍රතිපත්ති හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඕනෑ ම තීරණයක් ප්‍රසිද්ධියේ විවේචනය කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයකට සහයෝගය දක්වන බව ප්‍රකාශ කිරීම හෝ ඒ බවට හැඟවෙන ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයක් විසින් පාලනය කරනු ලබන ආණ්ඩුවක සහ හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයකට සහයෝගය දක්වන ප්‍රකාශයක් කිරීම හෝ ඒ බවට ඇඟවෙන ප්‍රකාශයක් කිරීම හෝ පක්ෂයට අගතිදායක ප්‍රතිඵල ගෙන දෙන සහ / හෝ පක්ෂය අපකීර්තියට පත් කරන හෝ මහජන අපකීර්තියට හේතු වන වෙනත් ඕනෑම ක්‍රියාවක නිතර වීම සිදු නොකළ යුත්තේය.

(ඇ) කිසිදු සාමාජිකයෙකු විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව වෙනත් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන සන්ධානයක් විසින් ඇති කරනු ලබන පරිපාලනයක් තුල තනතුරක් භාර ගැනීම හෝ ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධූරය සඳහා නාමයෝජනා කරනු ලැබීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස නාම යෝජනා කරනු ලැබීම හෝ තරඟ කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයක හෝ සන්ධානයක නාමයෝජනා ලැයිස්තුවක අපේක්ෂකයෙකු ලෙස නම ඇතුලත් කිරීම හෝ ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා ලැයිස්තුවක නම ඇතුල් කිරීම හෝ නොකළ යුත්තේය.

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත්සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු වන කිසියම් සාමාජිකයෙකු පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ යම් කරුණකට අදාළව පක්ෂය විසින් හෝ පාර්ලිමේන්තුවේ පක්ෂයේ ප්‍රධාන සංවිධායක හෝ පළාත් සභාවක කණ්ඩායම් නායක විසින් හෝ පළාත් පාලන ආයතනයක කණ්ඩායම් නායක විසින් හෝ දෙනු ලබන උපදෙස්වලට එරෙහිව ක්‍රියාකරමින් වෙනත් ස්ථාවරයක් දැරීම, කතා කිරීම, ඡන්දය ප්‍රකාශ කිරීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීම හෝ පක්ෂයේ මූලධර්ම ප්‍රතිපත්ති සහ නිර්ණායකවලට පටහැනිව ක්‍රියාකිරීම නොකළ යුත්තේය.

(ඉ) කිසිදු සාමාජිකයෙකු විසින් පක්ෂය විසින් හෝ පක්ෂයට අනුබද්ධිත සංවිධානයක් විසින් හෝ යම් නිලධාරියෙකු විසින් ගනු ලබන තීරණයකට

බලපෑම් කිරීම සඳහා පක්ෂයට හෝ පක්ෂ සංවිධානයකට හෝ නිලධාරියෙකු හට බලපෑම් කිරීම නොකළ යුත්තේය.

(ඊ) පක්ෂයේ ව්‍යවස්ථාව, පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පනවනු ලබන රීති, ස්ථාවර නියෝග, ආචාර ධර්ම පද්ධතිය හෝ තීරණ හෝ නියමයන් උල්ලංඝනය කරමින් හෝ අනුගමනය කිරීම පැහැර හරිමින් හෝ පක්ෂයේ උන්නතියට එරෙහිව කටයුතු කරන හෝ පක්ෂය අපකීර්තියට පත් කරවමින් හෝ ක්‍රියා කරන යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු විනය ක්‍රියාමාර්ගවලට යටත් විය යුතු අතර එවන් සාමාජිකයෙකුගේ හෝ නිලධාරියෙකුගේ සාමාජිකත්වය හෝ ධූරය අත්හිටුවීමට හෝ සාමාජිකත්වයෙන් නෙරපීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

(උ) කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සියලු විනය කටයුතු සඳහා සහ කෘත්‍යාධිකාරී මණ්ඩලයට නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන්ගෙන් ද සමන්විත විය හැකි 10 දෙනෙකුට නොවැඩි විනය කමිටුවක් කෘත්‍යාධිකාරී මණ්ඩලය පත් කරනු ලැබිය යුත්තේය. කිසියම් සාමාජිකයෙකුට එරෙහිව විනය පරීක්ෂණයක් සඟා විනය කමිටුව මගින් සාමාජිකයින් එක් අයෙක් හෝ වැඩි ගණනකින් යුත් විනය මණ්ඩලය මගින් ලබා දෙන නිර්දේශයන් මත විනය කමිටුව විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලයට එම නිර්දේශයන් ඉදිරිපත් කළ යුත්තේය.

(ඌ) පක්ෂයේ යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු යම් වරදක් සිදුකර ඇති බවට පක්ෂයේ මහලේකම්වරයා හට පැමිණිල්ලක් ලැබුණහොත් හෝ එසේ කර ඇති බවට පක්ෂයේ මහලේකම්වරයාට පෙනී ගිය විට පක්ෂයේ උපරිම

යහපත සහ ආරක්ෂාව පිණිස යම් සාමාජිකයෙකුට හෝ නිලධාරියෙකුට එරෙහිව අප්‍රමාදව තීරණයක් ගත යුතු යැයි පක්ෂයේ මහලේකම්වරයා විසින් එම සාමාජිකයාගේ හෝ නිලධාරියාගේ සාමාජිකත්වය සහ / හෝ නිළය අත්හිටුවන ලෙසට නිර්දේශ කරමින් වාර්තාවක් පක්ෂයේ නායකයා වෙත ඉදිරිපත් කළ හැකි අතර එවැනි වාර්තාවක් මත එම සාමාජිකයාගේ සහ / හෝ නිළය අත්හිටුවීමේ ක්‍රියාත්මක වීමක් ලෙස පක්ෂ නායකයාට බලය ඇත්තේය. එවැනි තීරණයක් ඊලගට පත්වනු ලබන කෘත්‍යාධිකාරී මණ්ඩලයට දනුම් දිය යුතු අතර එවැනි සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු විසින් නිදහස සඳහා කරුණු ඉදිරිපත් කිරීමක් ඇත්නම් / ඇත්තේනම් ඒ වනවිට එයද කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කළ යුත්තේය.

(එ) ඉහත සඳහන් පරිදි කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් සහ / හෝ පක්ෂයේ නායකයා විසින් විනය සම්බන්ධ කටයුතු පිළිබඳව ගනු ලබන තීරණයක් පිළිපැදීමට සියලුම සාමාජිකයන් බැඳී සිටින්නේය.

(ඒ) කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් විනය පරීක්ෂණ මණ්ඩලවල සේවය කළ යුතු සාමාජිකයින් ලැයිස්තුව අනුමත කළ යුතු අතර, යෝග්‍ය වන්නේ නම් විනය කමිටුවට අදාළව හෝ එකී විනය පරීක්ෂණ මණ්ඩල ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව හෝ රීති සැකසීම කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සිදු කළ හැක්කේය. විනය කමිටුවේ ලේකම් විසින් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු අතර පරීක්ෂණයෙන් අනාවරණය වන තොරතුරු කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

## 04 වන පරිච්ඡේදය

## 04 වන වගන්තිය

## පක්ෂ සංවිධානය

ප්‍රාදේශීය සංවිධාන

4.1 විධිමත්ව ලියාපදිංචි කරන ලද දිස්ත්‍රික් සංවිධාන, කොට්ඨාශ බලමණ්ඩල සහ ශාඛා සමිති එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සංවිධාන වෙයි. කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් සෑම දිස්ත්‍රික් සංවිධාන, කොට්ඨාශ බලමණ්ඩල සහ ශාඛා සමිතිවල ප්‍රාදේශීය බල සීමා නිර්ණය කිරීම සහ ඒවාහි සාමාජිකත්වය හා නිලයන් සම්බන්ධව රීති සෑදීම සිදු කළ යුත්තේය.

දිස්ත්‍රික් සංවිධානවල සංයුතිය

4.2.1 දිස්ත්‍රික් සංවිධාන පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

(ආ) දිස්ත්‍රික්කය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරුන්

(ඇ) පළාත් පාලන කණ්ඩායම්වල නායකයන්

(ඈ) කොට්ඨාස බලමණ්ඩලවල සභාපතිවරු

(ඉ) කොට්ඨාස කළමණාකාරවරු

(ඊ) කොට්ඨාස නීති ලේකම්වරු

(උ) දිස්ත්‍රික් කළමණාකාරවරු සහ කාන්තා සහ යොවුන් නියෝජිතයන් ඇතුළුව ස්ථාවර නියෝග මගින් දක්වා ඇති අනෙකුත් සාමාජිකයන්

කොට්ඨාස බලමණ්ඩලවල සංයුතිය

4.2.2 කොට්ඨාශ බලමණ්ඩල පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) කොට්ඨාසහ ඇතුළත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
(ආ) කොට්ඨාසහ ඇතුළත පළාත් සභා මන්ත්‍රීවරුන්
ඇ) පළාත් පාලන කණ්ඩායම්වල නායකයන්
(ඈ) බලමණ්ඩල සීමාව තුළ ශාඛා සමිති නායකයන්

සෑම දිස්ත්‍රික් සංවිධානයකටම සහ කොට්ඨාස බලමණ්ඩලයකටම ස්ථාවර නියෝගවලට අනුකූලව කාන්තා සහ යොවුන් නියෝජිතයන් ඇතුළුව ලේකම්වරයෙක්, භාණ්ඩාගාරිකවරයෙක්, කලමණාකරුවෙක් සහ නීති ලේකම්වරයෙක් සිටිය යුතුය.

4.2.3 කෘත්‍යාධිකාරි මණ්ඩලයේ එකගත්වය මත නායකයා විසින් කොට්ඨාස බලමණ්ඩල සහ දිස්ත්‍රික් බලමණ්ඩල සභාපතිවරුන් පත් කරනු ඇත.

දිස්ත්‍රික් සංවිධාන සහ කොට්ඨාස බලමණ්ඩලවල යුතුකම්

4.3 දිස්ත්‍රික් සංවිධාන සහ කොට්ඨාශ බලමණ්ඩල පහත සඳහන් කරුණු සම්බන්ධව සියලු පියවර ගත යුතු ය.

(1) (අ) එක් එක් දිස්ත්‍රික්ක හෝ කොට්ඨාශ තුළ පක්ෂයේ මූලධර්ම හා ප්‍රතිපත්ති වර්ධනය කිරීම හා පවත්වාගෙන යාම.

(ආ) එක් එක් දිස්ත්‍රික්ක හෝ කොට්ඨාශ තුළ කාර්යක්ෂම සහ ඵලදායී ලෙස මැතිවරණ ප්‍රචාරණ කටයුතු සංවිධානාත්මකව පවත්වාගෙන යාම.

(ඇ) පක්ෂය විසින් තරග කරන අවස්ථාවක දී එක් එක් දිස්ත්‍රික්ක හෝ කොට්ඨාශ තුළ පක්ෂයේ ජයග්‍රහණය තහවුරු කිරීම.

(ඇ) එක් එක් දිස්ත්‍රික්ක සහ කොට්ඨාශ තුළ පක්ෂයේ අරමුදල නගා සිටුවීම ඇතුළුව පක්ෂ කටයුතු සහ ප්‍රචාරණ වැඩ ප්‍රවර්ධනයෙහිලා සියලු පියවර ගැනීම.

(ඉ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් ගනු ලබන තීරණ, ප්‍රතිපත්ති හා විධානයන් ක්‍රියාත්මක කිරීම.

(2) එක් එක් දිස්ත්‍රික් සංවිධාන සහ බලමණ්ඩල මට්ටමින් ගනු ලබන තීරණයන් අදාළ දිස්ත්‍රික් සංවිධානයේ හෝ බලමණ්ඩලයේ ලේකම් විසින් පක්ෂයේ නායකතුමාට සහ මහලේකම්තුමාට අප්‍රමාදීව දැනුම් දිය යුතුය..

(3) පක්ෂ ව්‍යවස්ථාවට හෝ ප්‍රතිපත්ති හෝ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණයන්ට පටහැනිව කිසිම යෝජනාවක් පිළිගැනීම හෝ සාකච්ඡා කිරීම කිසිදු සංවිධානයක හෝ බල මණ්ඩලයක නොකළ යුතු ය.

(4) දිස්ත්‍රික් සංවිධාන සහ කොට්ඨාශ බලමණ්ඩල ඔවුන් වෙත පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පවරනු ලබන කාර්යයන් සම්බන්ධීකරණය, ප්‍රවර්ධනය ක්‍රියාත්මක කළ යුතුය.

**ශාඛා සමිති**

4.4 ශාඛා සමිති පක්ෂයේ මූලික සංවිධාන ව්‍යුහය වන්නේය. ඡන්ද මධ්‍යස්ථාන බල ප්‍රදේශයක් තුළ ශාඛා සමිති එකක් හෝ වැඩි ගණනක් තිබිය හැකි අතර එම සමිති පක්ෂයේ බල කේන්ද්‍රය ලෙස සැළකිය යුතුය. මෙහි පහත දක්වෙන පරිදි යම් ශාඛාවක්, ප්‍රධාන ශාඛාවක්, යොවුන් ශාඛාවක් හෝ වනිතා ශාඛාවක් පැවතිය හැකිය. එතෙකුදු වුවත්, ඡන්ද මධ්‍යස්ථාන බල ප්‍රදේශ දෙකකට හෝ වැඩි ගණනකට එක් ශාඛා සමිතියක් පැවතිය හැකිය.

ශාඛා සමිතිවල සැකැස්ම

4.5 ඡන්ද මධ්‍යස්ථාන බල ප්‍රදේශයක් තුළ පිහිටි ගමක, කොට්ඨාශයක හෝ එවැනි සමාන ප්‍රදේශයක පදිංචි පක්ෂ සාමාජිකයින් එකතු වී අවම වශයෙන් සාමාජිකයන් 25 දෙනෙකුගේ සමන්විත ප්‍රධාන ශාඛාවක් පිහිටුවාලිය හැකිය.

තරුණ ශාඛා සමිති

4.6 ඡන්ද මධ්‍යස්ථාන ප්‍රදේශයක් තුළ පිහිටි ගමක, කොට්ඨාශයක හෝ එවැනි සමාන ප්‍රදේශයක පදිංචි අවුරුදු 15 සහ 30 අතර ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම අයත් යොවුන් සාමාජිකයන් එකතු වී අවම වශයෙන් සාමාජිකයන් 25 දෙනෙකුගෙන් සමන්විත යොවුන් ශාඛාවක් පිහිටුවාලිය හැකිය.

කාන්තා ශාඛා සමිති

4.7 ඡන්ද මධ්‍යස්ථානයක් තුළ පිහිටි ගමක, කොට්ඨාශයක හෝ එවැනි සමාන ප්‍රදේශයක පදිංචි වනිතා සාමාජිකාවන් එකතු වී අවම වශයෙන් සාමාජිකයන් 25 දෙනෙකුගෙන් සමන්විත වනිතා ශාඛාවක් පිහිටුවාලිය හැකිය.

4.8. (1) එක් විටක දී කිසිම සාමාජිකයෙකුට එක ශාඛාවකට වඩා වැඩි ශාඛා ගණනක සාමාජිකත්වය දැරිය නොහැකිය.

(2) කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සකස් කරනු ලබන මගපෙන්වීම්වලට අනුකූලව ශාඛා සමිතියකට තම අභිමතය පරිදි පක්ෂයේ සාමාජිකයෙකු නොවන තැනැත්තෙකුට රැස්වීම්වලට සහභාගි වීමට සහ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට ඉඩදිය හැකිය.

අනුබද්ධිත සමිති

4.9 අනුබද්ධ සංවිධාන පහත සඳහන් සමිතිවලින් සමන්විත විය යුත්තේ,

වෘත්තීය සමිති

(අ) ජාතික සේවක සංගමය, ලංකා ජාතික වතු කම්කරු සංගමය, එක්සත් ජාතික පක්ෂයට අනුබද්ධිත වෘත්තීය සමිති, එක්සත් ජාතික පක්ෂයේ රාජ්‍ය

සේවා ජාතික වෘත්තීය සමිති සම්මේලනයට අනුබද්ධිත සමිති සහ පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් නියම කරන ලද ඔවුන්ගේ වාර්ෂික සාමාජික මුදල් එක් එක් වසරවල මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම පක්ෂයේ මහා භාණ්ඩාගාරික වෙත ගෙවා ඇති පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෘත්තීය සමිතිවලින් වෘත්තීය සමිති සමන්විත වන්නේය.

වෘත්තීයවේදීන්ගේ සංවිධානය

(ආ) පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියම කර ඇති වාර්ෂික සාමාජික මුදල් පක්ෂයේ මහා භාණ්ඩාගාරික වෙත එක් එක් වසරක් තුළ මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම පක්ෂයේ ගෙවා ඇති සහ නියමකර ඇති කොන්දේසි ඉටු කරන ලද වෘත්තියවේදීන්ගේ සංවිධාන සහ අනෙකුත් විශේෂ උනන්දුවක් දක්වනු ලබන කණ්ඩායම් හෝ සංවිධාන.

විදේශීය පුද්ගලයන්ගෙන් සැදුම්ලත් සංවිධාන

(ඇ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති සහ පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියම කර ඇති වාර්ෂික සාමාජික මුදල් පක්ෂයේ මහා භාණ්ඩාගාරික වෙත එක් එක් වසරවල මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවා ඇති සහ නියමකර ඇති කොන්දේසි ඉටු කරන ලද විදේශයන්හි ජීවත්වන පුද්ගලයන්ගෙන් සැදුම්ලත් අනුබද්ධිත සමිති හෝ සංවිධාන.

මාර්ගගත සංවිධාන

(ඈ) ඒවායෙහි පිහිටුවීම සහ ක්‍රියාකාරකම් වලට අදාළ වන ස්ථාවර නියෝගවලට අනුකූලව පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අනුමත කරන ලද මාර්ගගත සංවිධාන

4.10 (අ) ඉහත සඳහන් 4.9 අනු ව්‍යවස්ථාවේ සඳහන් ඕනෑම සංවිධාන සමිතියකට අවම වශයෙන් සාමාජිකයන් තිස්පස් (35) දෙනෙකුවත් නොමැත්තේ නම් සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් අදාල සංවිධානය අරමුණ, සම්පත්, සාමාජිකත්වය සහ වෙනත් නිර්ණායකයන් පිළිබඳව සළකා බලා කෘත්‍යාධිකාරී මණ්ඩලය එම සංවිධානය පක්ෂයේ අරමුණු, ප්‍රතිපත්ති සහ වැඩසටහන් වර්ධනය කිරීම සඳහා හැකි බවට තීරණය නොකරයි නම් ලියාපදිංචි නොකරනු ලැබිය යුත්තේය.

අනුබද්ධිත සංවිධාන නියෝජිතයින් (ආ) අනුබද්ධිත සමිතියක් විසින් පක්ෂයේ වාර්ෂික සම්මේලනයට හෝ සම්මේලනයේ විශේෂ සැසියකට සහ ජාතික විධායක කමිටුවට එවිය හැකි නියෝජිතයින් සංඛ්‍යාව කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කළ හැක්කේය.

අනුබද්ධිත සංවිධානවල ව්‍යවස්ථා (ඇ) පක්ෂයේ කෘත්‍යාධිකාරී කමිටුව මගින් එක් එක් අනුබද්ධිත සමිතියක් වෙනුවෙන් සුදුසු ව්‍යවස්ථාවක් අනුමත කරනු ලබන අතර අදාළ අනුබද්ධිත සමිතියේ සාමාජිකයන් එකී අනුමත කළ ව්‍යවස්ථාවෙන් බැඳී සිටිනු ඇත.

(ඈ) මෙම ව්‍යවස්ථාව බලගැන්වෙන අවස්ථාව වන විට පවත්නා අනුබද්ධ සංවිධාන ඒවාහි ව්‍යවස්ථාවන් මෙම ව්‍යවස්ථාවට අනුකූල වන පරිදි කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අවශ්‍ය යැයි කියනු ලබන සංශෝධන ඇතුළත් කරමින් එකී පැවති ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු ය.

(ඉ) සියලුම අනුබද්ධ සංවිධාන වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු අතර එකී වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාවක් කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) සියලුම දිස්ත්‍රික් සංවිධාන, කොට්ඨාස බලමණ්ඩල, ශාඛා සමිති සහ අනුබද්ධ සංවිධාන සහ ඒවාහි සාමාජිකයන් පක්ෂයේ ව්‍යවස්ථාව, රීති, ස්ථාවර නියෝග සහ ආචාර ධර්ම පද්ධතිය පිළිගෙන එය අනුව කටයුතු කිරීමට එකඟ විය යුතු අතර ඔවුන් විසින් පනවන ලද කොන්දේසි සහ රීති පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

සංවිධාන ඒකක ගණන

4.11 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට පහත සඳහන් බලතල ඇත්තේ ය.

(i) මැතිවරණ දිස්ත්‍රික්කයක තිබිය යුතු වූ සංවිධාන ඒකක, එනම් සංවිධාන කොට්ඨාශ ගණන තීරණය කිරීම.

(ii) දිස්ත්‍රික් සංවිධාන, කොට්ඨාශ බලමණ්ඩල, ශාඛා සමිති හා අනුබද්ධිත සංවිධාන සහ ඒවාහි සාමාජිකයින්, නිලධාරීන්, ඡන්ද බලය, රෙගුලාසි, සංයුතිය, ගාස්තු ගෙවීම, බලතල, ක්‍රියාවන්, වගකීම් සහ අනෙකුත් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් එක් කාලවකවානුවක දී ඊට අදාලව බලපාන රීති පැනවීම.

(iii) මෙම වගන්තියෙහි සඳහන් වන ඕනෑම දිස්ත්‍රික් සංවිධානයකට, කොට්ඨාශ බලමණ්ඩලයකට, ශාඛා සමිතියකට හා අනුබද්ධිත සංවිධානයකට හෝ ඔවුන් විසින් අනුගමනය කළ යුතු පොදු හෝ විශේෂ නියමයන් දීමට, එම නියමයන් පිළිපැදීමට එම සංවිධාන බැඳී සිටියි.

(iv) මෙම ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද මෙම වගන්තියෙහි සඳහන් වූ ඕනෑ ම දිස්ත්‍රික් සංවිධානයක්, කොට්ඨාශ බලමණ්ඩලයක්, ශාඛා

සමිතියක් හෝ අනුබද්ධිත සංවිධානයක් ස්වකීය පරම අභිමතය පරිදි විසුරුවා හැරීම.

නිලධාරීන් ඉවත් කිරීම

(v) දිස්ත්‍රික් සංවිධාන, කොට්ඨාශ බලමණ්ඩල, ශාඛා සමිති හා අනුබද්ධිත සංවිධානවල නිලධාරීන් ඔවුන්ට පැවරී ඇති කටයුතු සහ වගකීම් ඉටු කිරීමට අසමත් වුවහොත් හෝ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය අනුමත කළ සැළසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වුවහොත් එකී නිලධාරීන් ඉවත් කිරීම.

(vi) පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරු වශයෙන් ඔවුන්ගේ වගකීම් හා කටයුතු ඉටු කිරීමට අපොහොසත් වුවහොත් හෝ පැහැර හැරියහොත් එකී මන්ත්‍රීවරයා අදාල දිස්ත්‍රික් සංවිධාන, කොට්ඨාශ බලමණ්ඩල, ශාඛා සමිති හා අනුබද්ධිත සංවිධානවල සංවිධාන කටයුතුවලින් ඉත්හිටුවීම.

4.12 එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරනු ලබන්නා වූ පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වන්නා වූ සංවිධානයක් ද, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන්නා වූ පළාත් පාලන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වන්නා වූ සංවිධානයක් ද පැවැතිය යුත්තේය.

4.13 ඉහත 4.12 වගන්තිය මගින් පිහිටුවනු ලබන සංවිධානයන්හි සභාපතීත්වය සහ ධූර දරන්නන්ට විශේෂිතව අදාළ වන්නා වූ රීති කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සාදනු ලැබිය යුත්තේය. එවැනි සංවිධානවලට නිල බලයෙන් පත්විය යුතු සාමාජිකයන්ට අදාල රීති සැකසීම සහ එවැනි සංවිධාන වලට අදාල වගකීම් සහ රැස්වීම් පැවැත්වීම් සම්බන්ධව රීති සැකසීම ද කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සිදුකළ යුත්තේය.

## 05 වන පරිච්ඡේදය

## 05 වන ව්‍යවස්ථාව

## පක්ෂ සම්මේලනය

| | |
|---|---|
| ප්‍රතිපත්ති තීරණය කිරීම | 5.1 පක්ෂ සම්මේලනයක් මගින් පක්ෂයේ මූලධර්ම සහ ප්‍රතිපත්ති තීරණය කරනු ලබන අතර එවැනි කරුණු පිළිබඳ විධානයක් දිය හැකි ය. පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂ සම්මේලනයට වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේය. |
| සම්මේලනයේ බලතල | 5.2 පක්ෂ ව්‍යවස්ථාවට සහ ස්ථාවර නියෝගයන්වලට එකතු කිරීමෙන්, කපා හැරීමෙන්, වෙනස් කිරීමෙන්, පරිච්ඡින්න කිරීමෙන් සහ ප්‍රතියෝජනය කිරීමෙන් සංශෝධනය කිරීමට පක්ෂ සම්මේලනයට බලය ඇත. |
| සම්මේලනයේ කාර්ය පටිපාටිය | 5.3 පක්ෂ සම්මේලනයේ දී අනුගමනය කළ යුතු වන ක්‍රියාපටිපාටිය නිශ්චිත ලෙස ම පක්ෂ සම්මේලනය විසින් සාදනු ලබන පක්ෂ ස්ථාවර නියෝගවලට අනුකූල විය යුතුය. |
| සම්මේලනයෝ නියෝජිතයින් | 5.4 පක්ෂ සම්මේලනයට සහභාගී වන නියෝජිතයින් පහත සඳහන් පරිදි විය යුතු අතර එහෙත් 5000 නොඉක්මවන සංඛ්‍යාවකට සීමා විය යුතුය. එහි නියෝජිතයන් විය යුත්තේ, |
| | (අ) පක්ෂ සම්මේලනයේ මුලසුන දැරිය යුතු පක්ෂ නායකයා. |

(ආ) 8.1 ව්‍යවස්ථාවේ දැක්වෙන පක්ෂ නිළධාරීන්

(ඇ) ජාතික විධායක සභාවේ සාමාජිකයන්

(ඈ) පළාත් සභාවල සාමාජිකයන්

(ඉ) පළාත් පාලන ආයතන කණ්ඩායම්වල නායකයන් සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සාදනු ලබන රීතිවලට අනුකූල වන පරිදි එබඳු අනෙකුත් සාමාජිකයන්

(ඊ) දිස්ත්‍රික් සංවිධානවල සභාපතිවරු, දිස්ත්‍රික් කළමනාකාරවරු සහ නීති ලේකම්වරු

(උ) කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන්

(ඌ) ජාතික විධායක සභාව විසින් විශේෂ යෝජනා සම්මතයකින් තීරණය කළ සහ වාර්ෂික සම්මේලනයේ දි අනුමත කරන ලද වෙනත් නියෝජිතයන්

5.5 විශේෂ යෝජනා සම්මුතියක් මගින් වෙනත් තීරණයක් නොගෙන ඇති අවස්ථාවක පක්ෂ ව්‍යවස්ථාවේ සහ ස්ථාවර නියෝගවල සඳහන් කොන්දේසිවලට අනුකූලව පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල විසින් සෑම වසරක ම දෙසැම්බර් මාසයේ දී පමණ පක්ෂ සම්මේලනය පැවැත්වීමට කටයුතු කළ යුත්තේය. පක්ෂ නායකයා හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අවශ්‍ය යැයි හැඟෙන්නේ නම් පක්ෂ සම්මේලනයේ විශේෂ පක්ෂ සැසිවාරයක් කැඳවිය හැක්කේය.

5.6 ඉහත 5.5 ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද පක්ෂ සම්මේලනයේ විශේෂ සැසිවාරයේ වාර්ෂික පක්ෂ සම්මේලනය සාමාන්‍යයෙන් පවත්වන්නට ඇති දිනයට ආසන්නව පවත්වා ඇති අවස්ථාවක දී වාර්ෂික පක්ෂ සම්මේලනය පැවැත්විය යුතු දිනය

කල් තැබීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

5.7 විශේෂ සැසිවාරයක් සඳහා එයට පෙර අවම වශයෙන් දින 07 ක දැනුම් දීමක් සිදු කළ යුතු අතර විශේෂ සැසිවාරයක් සඳහා කැඳවීම් කර ඇති අවස්ථාවක එම කාලය ඇතුළත එකී සැසිවාරය සම්බන්ධ කරුණු හැර වෙනත් කිසිදු කටයුත්තක් සිදු නොකළ යුත්තේය.

යෝජනා සම්මුතිය දැනුම් දීම

5.8 (අ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සකසන ලද රීති ප්‍රකාරව වාර්ෂික පක්ෂ සම්මේලනය වෙත ඉදිරිපත් කිරීමට නියමිත යෝජනා සම්මුතිය ලිඛිතව පක්ෂ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) න්‍යාය පත්‍රයේ ඇතුළත් කර ඇති යෝජනා සම්මුතියට අමතරව පක්ෂ සම්මේලනයේ දී සළකා බැලීම සඳහා පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අනුමත කළහොත් හැර වෙනත් කිසිදු කරුණක් සලකා බලනු නොලැබිය යුත්තේය.

(ඇ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සුදුසු යැයි විශේෂිත ලෙස තීරණය කරනු ලබන්නේ නම් මිස, (ව්‍යවස්ථාවට) එකතු කිරීමෙන්, ඉවත් කිරීමෙන් හෝ වෙනස් කිරීම මගින් සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා සම්මුතියක සඳහන් වූ කරුණක් සම්බන්ධව වසරක කාලයක් ගත්නා තෙක් නම ඇතුලත් යෝජනා සම්මුතියක් ඉදිරිපත් නොකළ යුත්තේය.

**සම්මේලනයේ ඡන්දය ප්‍රකාශ කිරීම**

5.9 වාර්ෂික පක්ෂ සම්මේලනයේ දී හෝ විශේෂ සැසිවාරයක දී ඡන්දය දීමේ ක්‍රමය ඡන්ද පත්‍රිකා මගින් හෝ පක්ෂ නායකයා හෝ ඔහු නොමැති අවස්ථාවක පක්ෂ සභාපතිවරයා හෝ මූලාසනය දරන පුද්ගලයා විසින් නිර්ණය කරනු ලබන වෙනත් ක්‍රමයකට සිදු කළ යුත්තේය.

5.10 සෑම නියෝජිතයෙකුටම එක් ඡන්දයක් පමණක් භාවිතා කිරීමේ හිමිකම් ඇති අතර ඡන්ද විමසීමක දී යම්කිසි යෝජනාවක් හට සමාන ඡන්ද හිමිවන අවස්ථාවක දී පක්ෂ නායකයාට හෝ ඔහු නොමැත්තේ නම් පක්ෂයේ සභාපතිවරයාට හෝ සම්මේලනයේ මුලසුන දරන්නාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් භාවිතා කිරීමට අයිතිය ඇත්තේය.

## 06 වන පරිච්ඡේදය

## 06 වන ව්‍යවස්ථාව

## ජාතික විධායක සභාව

ජාතික විධායක සභාව

6.1 ජාතික විධායක සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් පහත සඳහන් පරිදි වේ.

(අ) ව්‍යවස්ථාවේ 5.1 අනු ව්‍යවස්ථාවට යටත්ව පක්ෂයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් තීරණය කිරීම.

(ආ) පක්ෂ ව්‍යවස්ථාවට සංශෝධන යෝජනා කර පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කිරීම සඳහා ඒවා කෘත්‍යාධිකාරී මණ්ඩලයට දැනුම් දීම සහ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නිර්ණය කරන ලද රීති අපරානුමත කිරීම සහ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම.

(ඇ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය, පාර්ලිමේන්තු කණ්ඩායම, පළාත් සභා කණ්ඩායම්, යොවුන්, කාන්තා සහ අනෙකුත් අනුබද්ධිත සංවිධාන විසින් ඉදිරිපත් කරන වාර්තාවන් භාර ගැනීම.

(ඈ) ජාතික විධායක සභාවේ සාමාජික ලැයිස්තුව පිළියෙල කිරීම සහ පවත්වාගෙන යාම.

(ඉ) පක්ෂයේ ජාතික විධායක සභාවට අවම වශයෙන් 25% ක කාන්තා නියෝජනයක් ලබා දීම පිණිස උත්සුක වීම. පක්ෂයේ ස්ථාවර නියෝගවලට අනුකූලව අවශ්‍ය වන්නේ නම් අමතර සාමාජිකයින් පත් කිරීම සහ පක්ෂයේ සියලුම සංවිධාන හා කමිටු සඳහා කාන්තා නියෝජනයක් ලබා දීමට උත්සුක වීම.

(ඊ) ස්ථාවර නියෝග මගින් දක්වෙන පරිදි ජාතික විධායක සභාවේ අනු කමිටු සහ උපදේශක කමිටු පත් කිරීම.

(උ) ස්ථාවර නියෝග මගින් පාලනය විය යුතු යැයි ව්‍යවස්ථාවේ දක්වා ඇති සියලු කාර්යයන් සඳහා ස්ථාවර නියෝග සම්පාදනය කිරීම සහ එම ස්ථාවර නියෝග ක්‍රියාත්මක වීම සමාලෝචනය කිරීම.

(ඌ) පක්ෂයේ අරමුණු සහ සාරධර්ම සඳහා සභය දී ප්‍රවර්ධනය කිරීම

(එ) පක්ෂ සාමාජිකයන්ගේ අදහස් සම්බන්ධව සැලකිලිමත් වීම සහ පක්ෂ නායකයා සහ පක්ෂ සාමාජිකයන් අතර සහසම්බන්ධතාව පවත්වාගෙන යාම

(ඒ) රටපුරා කාර්යක්ෂම සංවිධානයක් පවත්වාගෙන යාම තහවුරු කරන ක්‍රියාකාරකම් පිළිබඳව කෘත්‍යාධිකාරී මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම

(ඔ) වාර්ෂික ගිණුම් අනුමත කිරීම

(ඕ) ජාතික විධායක සභාවේ රැස්වීම් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් කැඳවිය යුතු අතර එම රැස්වීම්වල ක්‍රියාපටිපාටිය ස්ථාවර නියෝග අනුව සිදු කළ යුතුය.

සැකැස්ම

6.2 ජාතික විධායක සභාව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය.

(අ) පක්ෂයේ නායකතුමා

(ආ) 8.1 ව්‍යවස්ථාවේ දැක්වෙන පක්ෂ නිලධාරීන්

(ඇ) කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන්

(ඈ) පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජිකයන්

(ඉ) තරුණ සංවිධානයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන්

(උ) කාන්තා සංවිධානයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන්

(ඌ) පළාත් සභාවල කණ්ඩායම් නායකයන්

(එ) වාර්ෂික සම්මේලනයේ දී විශේෂ යෝජනා සම්මතයකින් සම්මත කරන ලද 25 කට නොවැඩි ගණනකින් යුත් පළාත් සභා කණ්ඩායම්වල නියෝජිතයන්

(ඒ) වාර්ෂික සම්මේලනයේ දී විශේෂ යෝජනා සම්මතයකින් සම්මත කරන ලද 25 කට නොවැඩි ගණනකින් යුත් පළාත් පාලන ආයතනවල කණ්ඩායම් නායකයන්

(ඔ) දිස්ත්‍රික් සංවිධානවල නායකයින්

(ඕ) දිස්ත්‍රික් කලමණාකාරවරුන්

(ක) දිස්ත්‍රික් නීති ලේකම්වරුන්

(ග) වාර්ෂික සම්මේලනයේදී විශේෂ යෝජනා සම්මතයකින් සම්මත කරන ලද අනුබද්ධ සංවිධානවල නියෝජිතයන්

(ච) වාර්ෂික සම්මේලනයේදී තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයන් 75 දෙනෙකු

(ජ) පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩල යෝජනා සම්මතයකින් ජාතික විධායක සභාවේ සාමාජික සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා ප්‍රතිපාදන සැකසිය හැකි අතර එකී සාමාජිකයන් පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශ මත පක්ෂ නායකයා විසින් පත්කල යුතුය.

6.3 යම් අයෙකු ඉහත දක්වෙන ආකාර දෙකකින් හෝ එයට වැඩි ආකාර ගණනකින් ජාතික විධායක සභාවේ සාමාජිකත්වය ලබා ඇත්තේ වුව ද එම තැනැත්තා හට සභාවේ එක් ඡන්දයක් පමණක් ප්‍රකාශ කිරීමට හිමිකම් ඇත්තේය.

6.4 ජාතික විධායක සභාව අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්විය යුතුය.

## 07 වන පරිච්ඡේදය

## 07 වන ව්‍යවස්ථාව

## පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය

සැකැස්ම

7.1 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන් ඇතුළු සාමාජිකයන් 50 දෙනෙකුට නොවැඩි තැනැත්තන් ගණනකින් සමන්විත විය යුතුය.

(අ) 8.1 ව්‍යවස්ථාවේ දැක්වෙන පක්ෂ නිළධාරීන්

(ආ) තරුණ සංවිධානයේ සභාපති

(ඇ) කාන්තා සංවිධානයේ සභාපති

(ඈ) පළාත් සභා කණ්ඩායම්වල නායකයන්

(ඉ) පාර්ලිමේන්තු කණ්ඩායමේ ප්‍රධාන සංවිධායක

(ඊ) පාර්ලිමේන්තු කණ්ඩායමෙන් තෝරාගන්නා ලද මන්ත්‍රීවරු 9 දෙනෙක්

(උ) ජාතික විධායක සභාවෙන් තෝරාගන්නා ලද සාමාජිකයන් 10 දෙනෙක්

(ඌ) ඉතිරි සාමාජිකයන් සංඛ්‍යාව පක්ෂ නායකයා විසින් පත්කළ යුතුය. කෙසේ වෙතත් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව 50 දෙනෙකු නොඉක්මවිය යුතුය.

(එ) කෙසේ නමුත් සාමාජික සංඛ්‍යාව 50 ඉක්මවන පරිදි වන ලෙස අමතර සාමාජිකයන් පත්කිරීම සඳහා වන ප්‍රතිපාදන සෑදීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂ නායකයාට නිර්දේශ කරනු ලැබිය හැකිය.

කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ගණ පූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/4 ක් විය යුතුය.

කෘත්‍යාධිකාරී මණ්ඩලයේ බලතල

7.2 (i) මෙම ව්‍යවස්ථාවේ, 5 (1) සහ 6 (1) (ඇ) ව්‍යවස්ථාවලට යටත්ව පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන තීරණය කර බලාත්මක කළ යුතු අතර පක්ෂයේ දේශපාලන උපායමාර්ග තීරණය කළ යුතුය. ව්‍යවස්ථාව මගින් ලබා දී ඇති බලතල සහ කර්තව්‍යයන්ට අමතරව පක්ෂයේ ක්‍රියාකාරකම් කළමණාකරණය කිරීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය. පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් විනය මණ්ඩලය, පරිපාලන කටයුතු පිළිබඳ මණ්ඩලයන් සහ කෘත්‍යාධිකාරී මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟෙන එවැනි වෙනත් මණ්ඩල පත් කළ හැකිය. කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් වෙනත් ඒ ආකාරයෙන් වූ මණ්ඩලයකට සිය කර්තව්‍යයන් පවරා දිය හැකිය.

(ii) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පත් කරනු ලබන මණ්ඩල සහ අනු මණ්ඩලය ලිත් වර්ෂයක් තුළ පමණක් ක්‍රියාත්මක විය යුත්තේය.
කෙසේ වෙතත් පසු එළඹෙන වර්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය හෝ මණ්ඩල හා අනු මණ්ඩල පත්වන තුරු හා ක්‍රියාත්මක වන තුරු පෙර වර්ෂයේ ක්‍රියාත්මක වූ කෘත්‍යාධිකාරී මණ්ඩල සහ අනු මණ්ඩල සිය කාර්යයන් ඉටු කළ යුත්තේය.

7.3 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු බලතල සහ කර්තව්‍යයන් නම්,

(i) පාර්ලිමේන්තු සැසිවාරයක් ආරම්භයේ දී හෝ වෙනත් ඕනෑම අවස්ථාවක හෝ පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමට පක්ෂය සම්බන්ධ සාකච්ඡාවන් පැවැත්වීමට.

(ii) පක්ෂ ව්‍යවස්ථාව සංශෝධනය සම්බන්ධයෙන් පක්ෂ සම්මේලනය වෙත යෝජනා ඉදිරිපත් කිරීම.

(iii) අවශ්‍ය අවස්ථාවල දී පක්ෂ සම්මේලනය හා විශේෂ සම්මේලන සැසිවාර කැඳවීම සහ සම්මේලන න්‍යාය පත්‍ර සැකසීම. එසේම ස්වකීය නිල කාලය තුළ පක්ෂයේ කටයුතු පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම ද ජාතික විධායක කමිටුවේ රැස්වීම් සම්බන්ධයෙන් සහ පක්ෂ සම්මේලනයේ රැස්වීම් හා එම රැස්වීම්වලට අදාල සියලු කාරණා සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය සම්පාදනය කිරීම.

(iv) ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ සහ වෙනත් මැතිවරණ ඇතුළු පක්ෂයේ අනෙකුත් කාරණා සඳහා අරමුදලක් සම්පාදනය කිරීම සහ පවත්වාගෙන යාම.

(v) කිසියම් බල මණ්ඩලයක හෝ ශාඛා සංවිධානයක හෝ අනුබද්ධ සංගමයක ඇතිවන්නා වූ අර්බුද නිරාකරණය කිරීම. එහි තීරණ අනුගමනය කිරීමට එම සියලු ම ආයතන බැඳී සිටින අතර එම තීරණ පිළිබඳව ජාතික විධායක සභාවට වාර්තා කළ යුතු වේ.

නාම යෝජනා මණ්ඩල

(vi) මැතිවරණයක් සඳහා අවශ්‍ය වන්නා වූ නාම යෝජනා මණ්ඩල හෝ නාම යෝජනා මණ්ඩල පත් කිරීම සහ මැතිවරණයන්ට අදාල සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ පක්ෂයේ අභිමතාර්ථ ඉටු කර ගැනීමට ඉහත කී මණ්ඩලයට හෝ

මණ්ඩලවලට සාමාන්‍ය හෝ විශේෂිත නියමයන් ලබා දීම.

අනු කමිටු

(vii) සියලුම දේශපාලන යාන්ත්‍රණයන් තීරණය කිරීම සහ ඒ පිළිබඳ වගකීම දැරීම සහ මැතිවරණයක් තරග කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය පිණිස අනු මණ්ඩල පත් කිරීම සහ අපේක්ෂකයෙකු හට සියලුම සහාය ලබා දීම.

විගණක

(viii) විගණකවරයෙකු පත් කිරීම

වෙනත් පත් වීම්

(ix) පක්ෂයේ සංවිධාන කටයුතු සහ පරිපාලන කටයුතු සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය යැයි හැඟෙන වෙනත් සියලු පත්කිරීම් සිදු කිරීම.

(x) පක්ෂයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන විශේෂ හදිසි මණ්ඩල හෝ අනු මණ්ඩල පත් කිරීම හෝ ඒ සඳහා අවශ්‍ය යැයි හැඟෙන වෙනත් පියවරයන් ගැනීම.

පුරප්පාඩු

(xi) අදාල මණ්ඩලවල හෝ නිලයන්හි පුරප්පාඩු පිරවීම. එසේ පත් කරන ලද නිලයන්හි ධූර කාලය ඊලඟ වාර්ෂික සම්මේලනය තෙක් බලපවත්වනු ලැබිය යුතුය.

(xii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතනවල සාමාජිකයන් ඇතුලත්ව සාමාජිකයන්ට අදාලව විනය නීති මාලාවක් රීති මගින් සම්පාදනය කිරීම.

(xiii) මැතිවරණ මෙහෙයුම් යාන්ත්‍රණය පිහිටුවීම සහ අදාළ පත්කිරීම් සිදු කිරීම

(xiv) ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් පක්ෂයේ ප්‍රචාරණය, සංවිධානය, සාමාජිකත්වය සහ අරමුදල් රැස්කිරීම සඳහා පක්ෂය සඳහා උපාය

මාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

(xv) පක්ෂයේ වාර් ෂික අයවැය සමාලෝචනය සහ අනුමත කිරීම, මූල්‍ය වියදම් සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම

(xvi) පක්ෂයට අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කිරීම

(xvii) පක්ෂ සාමාජික ලැයිස්තුවේ පරිපාලනය

(xviii) පළාත් පාලන සංවිධානවල සහ මාර්ගගත සංවිධානවල කළමනාකරණය සහ පරිපාලනය අධීක්ෂණය කිරීම

(xix) ඔවුන්ගේ පරම අභිමතය පරිදි පක්ෂ සාමාජිකයන්ගේ සහ සාමාජිකත්වය අපේක්ෂා කරන්නන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

(xx) දිස්ත්‍රික් සංවිධාන, කොට්ඨාශ බලමණ්ඩල, ශාඛා සමිති හා අනුබද්ධිත සංවිධානවල නිලතල දරන ඕනෑම අයෙකු ඉවත් කිරීම හෝ වෙනත් අයෙකු පත් කිරීම

(xxi) ඕනෑම නව අනුබද්ධ සංවිධානයක් පිහිටුවීම හෝ පවතින අනුබද්ධ සංවිධානයක් වෙනුවට වෙනත් සංවිධානයක් පිහිටුවීම

(xxii) පක්ෂ සම්මේලනය සංවිධානය කිරීම

රීති

7.4 (අ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය පක්ෂය වෙනුවෙන් තීරණ ගත යුතු අතර තවදුරටත් පක්ෂ ව්‍යවස්ථාවේ වගන්ති, රීති, ස්ථාවර නියෝග හෝ විනය රීති පද්ධතිය අර්ථකථනය කිරීම ද සිදු කළ යුතු ය. එවැනි තීරණයකින් සියලු සාමාජිකයන් බැඳී සිටිනි ලැබිය යුතු ය.

(ආ) මෙම ව්‍යවස්ථාව මගින් බලය පැවරෙන කරුණු සම්බන්ධයෙන් රීති පැනවීමටත්, ව්‍යවස්ථාවේ විධිවිධානයන් සිදු කිරීමටත් පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත.

(ඇ) කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සකසන්නා වූ රීති ඊළඟට පවත්වනු ලබන විධායක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමැතිය නොලද යම් රීතියක් අනුමැතිය නොලද දිනයේ සිට අවලංගු බවට සැළකෙන නමුත් එකී රීතිය යටතේ ඊට කලින් සිදු කළ කිසිදු ක්‍රියාවක් ඒ නිසා ම පමණක් බල රහිත නොවිය යුත්තේය.

ජාතික විධායක කමිටුව සතු බලතල ක්‍රියාත්මක කිරීම

7.5 ජාතික විධායක සභාව මගින් තමන් වෙත පවරන ලද බලතල කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත බලය පැවරී ඇති අතර ජාතික විධායක සභාව මගින් එකී බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් වෙනස් කරන හෝ ඉවත් කරන තුරු එහි සංයුතිය වෙනස් වුවද එකී බලය කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඇත්තේය. කෙසේ වුවද ව්‍යවස්ථාවෙන් විධායක සභාවට පැවරී ඇති බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් විධායක සභාවේ සැසිවාර අතරතුර දී ක්‍රියාත්මක කිරීමේ බලය පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඇත්තේය.

7.6 කෘත්‍යාධිකාරී මණ්ඩලයට පිළිගත හැකි හේතු දැක්වීමකින් තොරව එක දිගට රැස්වීම් 3 කට නොපැමිණෙන ඕනෑම කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයෙකුගේ සාමාජිකත්වය එනයින්ම අහෝසි විය යුත්තේය.

අන්තර්කාලීන බලතල

7.7 එළඹෙන ජාතික විධායක කමිටු රැස්වීම පවත්වන තෙක් බලපැවැත්වෙන පරිදි අන්තර්කාලීන ස්ථාවර නියෝග සම්පාදනය කිරීමේ බලය පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඇත්තේය. එම රැස්වීමේදී ජාතික විධායක සභාවට පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද එකී ස්ථාවර නියෝග සංශෝධන සහිතව හෝ රහිතව අනුමත කළ හැකිය. පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලබන එම ස්ථාවර නියෝග අතරින් එළඹෙන රැස්වීමේ දී ජාතික විධායක සභාව අනුමත නොකරන ස්ථාවර නියෝග එම එළඹෙන ජාතික විධායක සභා රැස්වීමේ දින සිට බල ශූන්‍ය වූවා ලෙස සැළකිය යුතු අතර එම ස්ථාවර නියෝග යටතේ එයට කලින් සිදු කරන ලද කටයුතුවලට ඉන් අගතියක් සිදු නොවිය යුතු ය.

7.8 ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පත්කරන ලද පක්ෂ ප්‍රතිපත්ති සංසදයක් තිබිය යුතුය. එහි මූලික කාර්යයන් විය යුත්තේ

1 පක්ෂය තුළ ප්‍රතිපත්ති අදහස් සහ මුලපිරීම් සකස් කිරීම සහ සංවර්ධනය කිරීම දිරිමත් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම

2 විශේෂයෙන්ම මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන කෙටුම්පත් කිරීමට අදාළවල සකස් කරන ලද සහ සංවර්ධනය කරන ලද ඕනෑම ප්‍රතිපත්ති අදහස් සහ මුලපිරීම් පිළිබඳව නායකතුමාට සහ කෘත්‍යාධිකාරී මණ්ඩලයට උපදෙස් දීම

## 08 වන පරිච්ඡේදය

## 08 වන ව්‍යවස්ථාව

## පක්ෂයේ නිලධාරීන්

නිලධාරීන් තෝරා පත් කර ගැනීම

8.1.1 පක්ෂය පහත පක්ෂ නිළධාරීන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) පක්ෂ නායකතුමා

(ආ) සභාපති

(ඇ) උප සභාපතිවරුන් දෙදෙනෙක්

(ඈ) මහ ලේකම්

(ඉ) නියෝජ්‍ය මහ ලේකම්

(ඊ) භාණ්ඩාගාරික

(උ) නියෝජ්‍ය භාණ්ඩාගාරික

(ඌ) නීති ලේකම්

පක්ෂ නිළධාරීන් පක්ෂයේ නායකතුමා විසින් වාර්ෂිකව පත්කළ යුතුය.

8.1.2 ඉහත තනතුරුවලට අමතරව කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සිය සාමාජිකයන් අතුරින් තවත් තනතුරු 5 ක් පක්ෂ නායකයා විසින් පත් කරනු පිණිස ඇතිකළ හැකිය.

8.1.3 පක්ෂ මහලේකම් හෝ භාණ්ඩාගාරික පාර්ලිමේන්තු මැතිවරණයක් හෝ වෙනත් කිසිදු මැතිවරණයක් සඳහා තරග නොකරනු ලැබිය යුතුය.

8.2.1 මෙම ව්‍යවස්ථාව බලාත්මක වන දිනට පෙර පක්ෂ නායක තනතුරේ සිටින තැනැත්තා තවත් වසර හයක කාලයක් සඳහා පක්ෂ නායකයා වියයුතු අතර නැවත ධූර කාලයක් සඳහා තේරීපත් වීමට ද සුදුසුකම් ලැබිය යුතුය.

8.2.2 නැවත ධූරකාලයක් සඳහා තෝරාගතහොත් මිස පක්ෂ නායකතුමා වසර 6 ක කාලයක් සඳහා ධූරය දරනු ලැබිය යුතුය. පක්ෂ නායක ධූරය පුරප්පාඩු වූ අවස්ථාවක ජාතික විධායක සභාව රැස් වී නව නායකයා තෝරාපත් කර ගත යුතුය.

8.3 තේරී පත් වූ හෝ පත් කළ නිලධාරීන් විසින් තම ධූරයන්ට අදාළ බලතල, ක්‍රියාකාරකම් සහ යුතුකම් එක් ලිත් වර්ෂයක් සඳහා වූ කාලයක් තුළ ක්‍රියාත්මක කළ යුත්තේය. කෙසේ වුව ද පිළිගත හැකි හේතූන් සලකා කෘත්‍යාධිකාරී මණ්ඩලයට එම කාල සීමාව මාස 03 ක් දක්වා දීර්ඝ කිරීමට බලය ඇත්තේය. කෙසේ වුව ද ඔවුන් විසින් නව නිලධාරීන් තෝරා පත් කර ගන්නා තුරු සහ ඔවුන් නිලතල භාරගෙන ක්‍රියාකරන තුරු එම ධූරයන්හි කටයුතු සහ ක්‍රියාකාරකම් ඉටු කළ යුත්තේය.

8.4 දේශපාලන උපාය මාර්ග සකස් කිරීම සඳහා වන පක්ෂ නායකයාගෙන් සහ ඔහු විසින් වාර්ෂිකව පත්කරනු ලබන කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන් 9 දෙනෙකුගෙන් සමන්විත උත්තරීතර මණ්ඩලයක් පක්ෂයට තිබිය යුතුය. උත්තරීතර මණ්ඩලය විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත දේශපාලන උපාය මාර්ග පිළිබඳව යෝජනා ඉදිරිපත් කළ යුතු අතර එම උපාය මාර්ග බලාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කළ යුතුය.

උත්තරීතර මණ්ඩලයේ රැස්වීම් කැඳවීම පක්ෂ නායකයා විසින් සිදුකළ යුතු අතර ඔහු විසින් එම රැස්වීම්වල මුලසුන දැරිය යුතුය.

8.5 පක්ෂයේ නායකවරයාට රැස්වීම්වල මුලසුන හෙබවීමේ සහ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සහ පක්ෂයේ සාමාජිකයන් සහ නිලධාරීන් වෙත නියමයන් නිකුත් කිරීමට බලය ඇත්තේය. එම නියමයන්වලින් පක්ෂයේ සාමාජිකයන් සහ නිලධාරීන් බැඳී ඇත්තේය. පක්ෂ නායකවරයා නොමැති අවස්ථාවල දී පක්ෂයේ සභාපතිවරයා විසින් රැස්වීම්වල මුලසුන දැරිය යුත්තේය.

8.6 ඉහත ව්‍යවස්ථාවන්හි කෙසේ සඳහන් වුව ද, පක්ෂයේ කුමන හෝ නිලයක හෝ කෘත්‍යාධකාරී මණ්ඩලයේ සාමාජිකත්වයේ කිසියම් ඇබැර්තු පැවතියේ වුව ද පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍යය සිදු කර ගෙන යාමට බලය ඇත්තේය.

## 09 වන පරිච්ඡේදය

## 09 වන ව්‍යවස්ථාව

## ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු සහ වෙනත් මැතිවරණ

**අපේක්ෂකයන් නම් කිරීම**

9.1 ජනාධිපතිවරණයක දී අපේක්ෂකයෙකුගේ නම යෝජනා කිරීම, පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පත් කරනු ලැබූ නාම යෝජනා කිරීමේ මණ්ඩලය විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලය විමසා කරනු ලැබිය යුතුය. කෙසේ නමුත් ජනාධිපති ධූරය සඳහා තරග කරනු ලබන පක්ෂය විසින් නම් කරනු නොලැබූ අපේක්ෂකයෙකුට සහය දීම සඳහා පක්ෂය විසින් තීරණය කරනු ලැබිය හැකිය.

9.2 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පත් කරනු ලැබූ නාම යෝජනා කිරීමේ මණ්ඩලය හෝ මණ්ඩල විසින් පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විමසීමෙන් පසුව සහ අදාළ දිස්ත්‍රික් බලමණ්ඩලයේ අදහස් විමසීම අවශ්‍ය යැයි කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සළකනු ලැබුවහොත් අදාළ දිස්ත්‍රික් බලමණ්ඩලය විමසීමෙන් පසු යම් පාර්ලිමේන්තු මැතිවරණයක් සඳහා හෝ පළාත් සභා ඡන්ද විමසීම් සඳහා හෝ පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් සඳහා හෝ වෙනත් ඡන්ද විමසීම් සඳහා අපේක්ෂකයෙකුගේ නැතහොත් අපේක්ෂකයන්ගේ නාම යෝජනා කරනු ලැබිය යුතුය.

9.3 ජනාධිපතිවරයාගේ ධූර කාලය අවසන් වීමට ප්‍රථම ජනාධිපති ධූරය හිස් වුවහොත්, සභාපතිවරයාගේ

ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු කණ්ඩායම සහ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය ඒකාබද්ධව පවත්වනු ලබන විශේෂ රැස්වීමක දී ජනාධිපති ධූරය සඳහා සුදුසු අපේක්ෂකයෙකු රහස් ඡන්දයකින් තෝරා ගත යුතු ය. කෙසේ නමුත් වෙනත් අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය සඳහා සහය දීමට පක්ෂය විසින් තීරණය කරනු ලැබිය හැකිය.

අපේක්ෂකයාගේ ප්‍රතිඥාව / දිවුරුම

9.4 යම් පුද්ගලයෙකු ජනාධිපති ධූරයට, පාර්ලිමේන්තුවට, පළාත් සභාවකට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ වෙනත් අධිකාරියකට පක්ෂය වෙනුවෙන් තෝරා පත් කර ගනු ලැබුවහොත් පක්ෂයේ මූලධර්ම වලට, ප්‍රතිපත්තිවලට, වැඩසටහන්වලට සහ චර්යා ධර්ම පද්ධතියට අනුකූලව කටයුතු කරන බවටත්, පක්ෂයේ ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝගවලට සහ රීතිවලට සහ ආචාරධර්ම පද්ධතියට අනුකූලව කටයුතු කරන බවටත්, සභාපතිවරයා හෝ මහලේකම්වරයා විසින් ඔහුට දෙනු ලබන පක්ෂයේ තීරණ ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලබන බවටත් ප්‍රතිඥාවක් / දිවුරුමක් දිය යුතු ය. ඒ ප්‍රතිඥාව / දිවුරුම් දීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඒ වරදට දඬුවම් දීම සඳහා අවශ්‍ය විනයානුකූල පියවර කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගනු ලැබිය යුතු ය.

9.5 ඉහත සඳහන් ප්‍රතිඥාව / දිවුරුම් දීම ඔහු විසින් දෙනු ලැබූ පසු පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් ඔහු ඉදිරිපත් කරන අතර, එම මැතිවරණ සඳහා තරඟ කිරීමේ දී හැකි සෑම ආධාරයක් ම පක්ෂය විසින් ඔහුට ලබා දෙනු ලැබිය යුතු ය.

9.6 එසේ ස්ථිර කරනු ලැබූ සෑම අපේක්ෂකයෙකු ම "එක්සත් ජාතික පක්ෂයේ" අපේක්ෂකයෙකු වශයෙන් පමණක් මහජනයා ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, මැතිවරණ රැස්වීම් අමතා කථා කිරීමේ දී පක්ෂයේ ප්‍රතිපත්තිවලට සහ එකී මැතිවරණය සඳහා අදාළ කරුණු වශයෙන් පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සහ මැතිවරණ ප්‍රකාශනය මගින් නිශ්චය කොට දක්වනු ලබන කරුණුවලට ඔහු විසින් ප්‍රමුඛත්වය දිය යුතු ය.

**පක්ෂයේ මූලධර්මවලට අනුකූලව කටයුතු නොකිරීම**

9.7 පක්ෂයේ මූලධර්මවලට, ප්‍රතිපත්තිවලට, වැඩසටහන්වලට, චර්යා ධර්ම පද්ධතියට සහ පක්ෂයේ ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝගවලට හා රීතිවලට අනුකූල ක්‍රියා කිරීමට යම් අපේක්ෂකයෙකු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු ව්‍යවස්ථාව උල්ලංඝනය කළ තැනැත්තෙකු ලෙස සළකනු ලැබිය යුතු අතර, පක්ෂයෙන් නෙරපා හැරීම ද ඇතුලත්ව විනය ක්‍රියාමාර්ගයකට ද යටත් වන්නේය.

## 10 වන පරිච්ඡේදය

## 10 වන ව්‍යවස්ථාව

## ස්ථාවර නියෝග

ස්ථාවර නියෝගයන්ගේ ක්‍රියාත්මකභාවය

10.1 පක්ෂයේ ස්ථාවර නියෝග කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සෑදිය යුතු අතර පක්ෂ සම්මේලනය විසින් අනුමත කළ යුතුය. ස්ථාවර නියෝගයන්ගෙන් පක්ෂයේ සියලුම සාමාජිකයන් බැඳී සිටී.

10.2 අලුත් ස්ථාවර නියෝගයන් පැනවීමට, පවත්නා ස්ථාවර නියෝගයන් සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට හෝ වෙනස් කිරීමට ජාතික විධායක සභාවට බලය ඇත්තේය.

10.3 අලුත් ස්ථාවර නියෝග, රීති සහ රෙගුලාසි සකස් කර අනුමත කරන තුරු මාස හයක කාලයක් දක්වා පක්ෂයේ කටයුතු පාලනය කිරීමට පක්ෂ නායකයාට බලය ඇත්තේය.

10.4. මෙම ව්‍යවස්ථාව බලාත්මකභාවයට පැමිණ වසරක කාලයක් ඉකුත් වීමට පෙර මැතිවරණයක් පැවැත්වෙන්නේ නම් ද සහ ඒ වන විට කෘත්‍යාධිකාරී මණ්ඩලය, ජාතික විධායක සභාව හෝ පක්ෂ සම්මේලනය ඇතුලුව එතෙක් පිහිටුවා නොමැති හෝ ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති කුමන හෝ පක්ෂ ආයතනයක් වේ නම්, පක්ෂ නායකයා විසින් එකී ආයතනවලට හිමි බලතල ක්‍රියාත්මක කළ යුතුය.

## 11 වන පරිච්ඡේදය

## 11 වන ව්‍යවස්ථාව

## ජාතික යොවුන් පෙරමුණ

සුදුසුකම්

11.1 (අ) එක්සත් ජාතික පක්ෂයේ ජාතික යොවුන් පෙරමුණ එක්සත් ජාතික පක්ෂ යෞවනයන්ගේ දේශපාලන සංවිධානය වන අතර වයස අවුරුදු 15-30 ත් අතර ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම එය විවෘත ය.

(ආ) ජාතික යොවුන් පෙරමුණ සහ පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අනුමත කරන ලද එහි සම්බන්ධිත ආයතන පක්ෂයේ ව්‍යවස්ථාව, ස්ථාවර නියෝගවලට, රීතිවලට, මූලධර්මයන්ට, ප්‍රතිපත්ති සහ වැඩසටහන්වලට අනුකූලතාවය දැක්විය යුතුය.

සාමාජිකත්වය පිළිබඳ කොනන්දේසි

(ඇ) ජාතික යොවුන් පෙරමුණේ සාමාජිකත්වය මෙම පරිච්ඡේදයේ සඳහන් විධිවිධානයයන්ට සහ පක්ෂ කෘත්‍යාධිකාරී කමිටුව මගින් පනවන ලද රීතිවලට ද යටත් විය යුතු ය.

යොවුන් ශාඛා

11.2 (අ) පක්ෂ ව්‍යවස්ථාවේ 4.6 ව්‍යවස්ථාවට අනුකූලව එක් ගමක, කොට්ඨාශයක හෝ සමාන ප්‍රදේශයක යොවුන් ශාඛා පිහිටුවිය හැකිය.

(ආ) සංවිධාන කොට්ඨාශයක් තුළ පිහිටා ඇති යොවුන් ශාඛා එකතු වීමෙන් කොට්ඨාශ යොවුන් පෙරමුණ සමන්විත වන්නේය.

(ඇ) එසේ සැදුම් ලත් සියලු කොට්ඨාශ යොවුන් පෙරමුණු එකතු වීමෙන් එක්සත් ජාතික පක්ෂයේ ජාතික යොවුන් පෙරමුණ සමන්විත වන අතර එහි සභාපති උපදේශක සභාවේ නිර්දේශ සහ

කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමත කිරීම මත පක්ෂ නායකතුමා විසින් පත් කළ යුත්තේය.

විධායක කමිටුව

(ඈ) එක්සත් ජාතික පක්ෂයේ ජාතික යොවුන් පෙරමුණ විධායක කමිටුවකින් සහ කෘත්‍යාධිකාරී කමිටුවකින් සමන්විත වන්නේය.

රීති

(ඉ) එක්සත් ජාතික පක්ෂයේ ජාතික යොවුන් පෙරමුණ, එහි විධායක කමිටුවල, කෘත්‍යාධිකාරී කමටුවට සහ එහි සියලුම සංවිධානවලට අදාල වන පත් කිරීම්, සාමාජිකත්වය සැකසීම්, රැස්වීම් බලතල, යුතුකම් සහ ක්‍රියාදාමයන් සම්බන්ධ රීතින් පැනවීම ද ඒවායේ සියලු ක්‍රියාකාරකම් සහ ඒවායේ විධිමත් බව සහ ක්‍රියාකාරිත්වය අරබයා නියෝග ලබා දීමට පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට හැක්කේය.

## 12 වන පරිච්ඡේදය

## 12 වන ව්‍යවස්ථාව

## එක්සත් ලක් වනිතා පෙරමුණ

සුදුසුකම්

12.1 (අ) එක්සත් ජාතික පක්ෂයේ එක්සත් ලක් වනිතා පෙරමුණ එක්සත් ජාතික පක්ෂ කාන්තාවන්ගේ දේශපාලන සංවිධානයක් වන අතර එහි සාමාජිකත්වය අවුරුදු 15 ට වැඩි ශ්‍රී ලංකා පුරවැසියන් වන සියලුම කාන්තාවන් සඳහා විවෘත ය.

(ආ) එක්සත් ලක් වනිතා පෙරමුණ සහ පක්ෂ කෘත්‍යාධිකාරී කමිටුව විසින් අනුමත කරන ලද එහි අනුබද්ධ ආයතන පක්ෂයේ ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝගවලට, රීතිවලට, මූලධර්මයන්ට, ප්‍රතිපත්ති සහ වැඩසටහන්වලට අනුකූලතාවය දැක්විය යුතු ය.

සාමාජිකත්වය පිළිබඳ කොන්දේසි

(ඇ) එක්සත් ලක් වනිතා පෙරමුණේ සාමාජිකත්වය මෙම පරිච්ඡේදයේ සඳහන් විධිවිධානවලට සහ පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් පනවන ලද රීතිවලට යටත් විය යුතුය.

වනිතා ශාඛා

12.2 (අ) පක්ෂ ව්‍යවස්ථාවේ 4.7 ව්‍යවස්ථාවට අනුකූලව එක් එක් ගමක, කොට්ඨාශයක (Ward) හෝ සමාන ප්‍රදේශයක ලක් වනිතා ශාඛා පිහිටුවිය හැකිය.

කොට්ඨාශ පෙරමුණ

(ආ) කොට්ඨාස බලමණ්ඩලයක් තුළ පිහිටි සියලුම ලක් වනිතා ශාඛා එකතු වීමෙන් කොට්ඨාශ ලක් වනිතා පෙරමුණ සැදුම් ලන්නේය.

එක්සත් ලක් වනිතා පෙරමුණේ සභාපතිනිය

(ඇ) කොට්ඨාශ ලක් වනිතා පෙරමුණු එකතු වීමෙන් එක්සත් ජාතික පක්ෂයේ එක්සත් ලක් වනිතා

පෙරමුණ සැදුම් ලන අතර එහි සභාපතිනිය නායකයා විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශ මත පත් කළ යුත්තේය.

විධායක කමිටුව

(ඇ) එක්සත් ජාතික පක්ෂයේ එක්සත් ලක් වනිතා පෙරමුණ විධායක කමිටුවකින් සහ කෘත්‍යාධිකාරී කමිටුවකින් සමන්විත වන්නේය.

(ඉ) එක්සත් ජාතික පක්ෂයේ එක්සත් ලක් වනිතා පෙරමුණට, එහි විධායක කමිටුවට, කෘත්‍යාධිකාරී කමිටුවට සහ එහි සියලු ම සංවිධාන වලට අදාල වන පත් කිරීම්, සමාජිකත්ව සංයුතිය, රැස්වීම් බතල, යුතුකම් සහ ක්‍රියාදාමයන් සම්බන්ධ රීතීන් ද අදාල සියලු ක්‍රියාකාරකම් සහ ඒවායේ විධිමත් බව සහ ක්‍රියාකාරිත්වය අරබයා නියෝග ලබා දීමට පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

## 13 වන පරිච්ඡේදය

## 13 වන ව්‍යවස්ථාව

## එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම සහ එහි අරමුණු

පාර්ලිමේන්තුව තුළ පක්ෂය

13.1 (අ) එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම වශයෙන් හඳුන්වනු ලැබිය යුත්තේ ය.

(ආ) පාර්ලිමේන්තු කණ්ඩායම පක්ෂයේ නායකයා විසින් නිකුත් කරනු ලබන නියෝගවලින් සහ උපදෙස්වලින් බැඳී සිටී.

කාර්යය

13.2 එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම පක්ෂ නායකතුමන්ගේ මෙහෙයවීම යටතේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය, පක්ෂ ප්‍රතිපත්ති සහ වැඩසටහන්වලට අදාලවන සෙසු වෙනත් කරුණු සාකච්ඡා කළ යුතු අතර එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තීන් සහ වැඩසටහන් ප්‍රවර්ධනය කළ හැකි සියලු පියවර ගත යුතුය.

ප්‍රතිඥාව / පොරොන්දුව

13.3 එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ සෑම සාමාජිකයෙකු විසින් ම පක්ෂයට පක්ෂපාතී බවට ප්‍රතිඥාවක් / දිවුරුමක් දිය යුතු ය.

පාර්ලිමේන්තු කණ්ඩායම් නායකයා

13.4 පක්ෂයේ නායකයා, පාර්ලිමේන්තුවරයෙකු වන විට දී ඔහු පාර්ලිමේන්තු කණ්ඩායමේ ද නායකයා විය යුතු ය. පක්ෂයේ නායකයා පාර්ලිමේන්තු

කණ්ඩායමේ සාමාජිකයෙකු නොවන විට පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකත්වය සඳහා පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජිකයෙකු පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයා වශයෙන් පක්ෂයේ නායකයා විසින් පත් කරනු ලැබිය යුතුය.

| | | |
|---|---|---|
| කසය | 13.5 | පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම විසින් කණ්ඩායමේ පාර්ලිමේන්තු කණ්ඩායම් ප්‍රධාන සංවිධායක සහ නියෝජ්‍ය සංවිධායක තෝරා පත් කර ගත යුතු ය. |
| පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීම | 13.6 | පක්ෂයේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන සංවිධායක මගින් දැනුම් දෙනු ලබන නියෝගය අනුව සෑම සාමාජිකයෙකු ම සෑම විට ම පාර්ලිමේන්තුවේ සිය ඡන්දය ප්‍රකාශ කළ යුතු ය. |
| | 13.7 | යම් පාර්ලිමේන්තු, මන්ත්‍රීවරයෙකු පක්ෂයේ සංවිධායක විසින් නිකුත් කරන උපදෙස් පිළිපැදීමට අසමත් වන අවස්ථාවක සහ / හෝ පක්ෂයට පටහැනිව ඔහු විසින්ම කටයුතු කරන අවස්ථාවක හෝ පාර්ලිමේන්තුව තුළ පක්ෂයේ සෙසු මන්ත්‍රීවරුන් සමග අසුන් නොගන්නේ නම් හෝ ඔහුට පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ඇති අයිතිවාසිකම් අහිමි කිරීමට කෘත්‍යාධිකාරි මණ්ඩලයට බලය ඇත. |
| ආචාර ධර්ම පද්ධතිය | 13.8 | පාර්ලිමේන්තු කණ්ඩායමේ සියලුම සාමාජිකයන් චර්යා ධර්ම පද්ධතියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය. |
| හෘදය සාක්ෂියට එකඟව කටයුතු කිරීමේ නිදහස | 13.9 | පක්ෂයේ ප්‍රතිපත්තියට අදාල යම් කරුණක් පිළිබඳව ස්වකීය හෘදය සාක්ෂියට අනුව එකඟව කටයුතු කිරීමට අපහසු අවස්ථාවක පක්ෂ |

නායකයාගේ ලිඛිත අනුමැතියට යටත්ව ඡන්දය දීමෙන් වැළකී සිටීමේ නිදහස ඔහුට ඇත්තේ ය.

පුද්ගලික මන්ත්‍රී යෝජනා

13.10 පක්ෂ ප්‍රතිපත්තිය පිළිබඳ යම් ප්‍රශ්නයක් නැතහොත් මුදල් පිළිබඳ ප්‍රශ්නයක් උද්ගත නොවන්නා වූ හෝ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය නැතහොත් ජාතික විධායක සභාව විසින් තීරණයක් ගනු නොලැබ, මන්ත්‍රීවරුන්ගේ පුද්ගලික පනත් කෙටුම්පත් හෝ යෝජනා සම්බන්ධයෙන් ඔහුගේ අභිමතය පරිදි ක්‍රියා කිරීමේ නිදහස පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජිකයන්ට ඇත්තේය.

13.11 යම්කිසි විවාදයකට සහභාගී වීමට අපේක්ෂා කරන සාමාජිකයන් විසින් තම අවශ්‍යතාවය පක්ෂ සංවිධායකට දැනුම් දිය යුතු අතර, පක්ෂ සංවිධායක විසින් පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයා සමග සාකච්ඡා කර කථා කිරීමේ අනුපිළිවෙල ඒ සාමාජිකයාට දන්වනු ලැබිය යුතුය.

13.12 පක්ෂ ප්‍රතිපත්තිවලට අදාල යම් කරුණු පිළිබඳව තමන්ට යම් සැකයක් ඇති විටකදී පක්ෂයේ රැස්වීම්වල දී ඒ පිළිබඳව ප්‍රශ්න මතු කිරීමට ඇති අවස්ථාවෙන් සාමාජිකයන් විසින් සම්පූර්ණ ප්‍රයෝජනය ගත යුතුය.

13.13 පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ අනුමැතිය නොමැතිව ඡන්ද විමසීම සඳහා ඉල්ලීමක් නොකළ යුතුය.

13.14 පක්ෂයේ ප්‍රතිපත්ති කෙරෙහි බලපාන ඇතැම් කරුණුවලදී නිදහසේ ක්‍රියාකිරීමට සාමාජිකයන්ට ඉඩදිය හැකි අතර, ඔහු ප්‍රකාශ කරන්නේ ඔහුගේ පෞද්ගලික අදහස් බව එවැනි විවාදයකට සහභාගී වන සාමාජිකයෙකු විසින් පැහැදිලි කළ යුතුය. විවාද වල දී කථා කරන සාමාජිකයන් විසින් සිය කථාවලදී පක්ෂයේ අනෙකුත් සාමාජිකයන් විවේචනය කිරීමෙන් වැළකී සිටීමට විශේෂයෙන් වග බලා ගත යුතු ය.

කණ්ඩායම් රැස්වීම්

13.15 පක්ෂයේ නායකයා විසින් අවශ්‍ය යැයි සළකනු ලබන කරව අවස්ථාවක දී වුව ද පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීමක් කැඳවීමට ඔහුට බලය ඇත.

13.16 පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජිකයන් දස (10) දෙනෙකු විසින් අත්සන් කරන ලද ඉල්ලීමක් මගින් රැස්වීමකක් කැඳවන ලෙස ඉල්ලා සිටිය හැක.

## 14 වන පරිච්ඡේදය

## 14 වන ව්‍යවස්ථාව

## පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සභික මන්ත්‍රීවරු

**පළාත් සභා සහ පළාත් පාලන කණ්ඩායම**

14.1 එක් එක් පළාත් සභාවක් සඳහා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන්ගෙන් සමන්විත වන එම පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් එක්සත් ජාතික පක්ෂයේ පළාත් සභා කණ්ඩායම සමන්විත වන අතර එක් එක් පළාත් පාලන ආයතනයේ එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකත්වය දරන සාමාජිකයන්ගෙන් සමන්විත එක්සත් ජාතික පක්ෂ පළාත් පාලන ආයතනවල මන්ත්‍රී කණ්ඩායම ස්ථාපනය විය යුත්තේය.

**කණ්ඩායමේ නායකයා**

14.2 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් උපදේශන සභාවේ නිර්දේශ මත එක් එක් පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමේ නායකයා පත් කළ යුතු අතර ප්‍රධාන සංවිධායකවරයා පත් කිරීම, සාමාජිකයන්ගේ පාලනය සහ එම කණ්ඩායම්වලට අදාල ගැටළුවලට අදාල කාරණා සඳහා රීති සෑදීම කළ යුත්තේය.

14.3 පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු පක්ෂයේ කණ්ඩායම් නායකයාගේ නියෝගය අනුගමනය කිරීම පැහැර හැරියහොත් හෝ පක්ෂය සමග පැවැත්විය යුතු සම්බන්ධතාවය නොපැවැත්වුවහොත් හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක වෙනත් පක්ෂයක් සමඟ එක්ව අසුන් ගතහොත් හෝ එම පළාත් සභා මන්ත්‍රී හෝ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරයාට පළාත්

සභා හෝ පළාත් පාලන මන්ත්‍රී කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් හිමි විය යුතු හිමිකම් හා වරප්‍රසාද අහිමි විය යුතු බවට කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කළ හැක්කේය.

15 වන පරිච්ඡේදය

15 වන ව්‍යවස්ථාව

## චංචල හා නිශ්චල දේපල

දේපල අත්පත් කර ගැනීම

15.1 පක්ෂය විසින් චංචල හා නිශ්චල දේපල අත් කර ගැනීම නීත්‍යානුකූල වන අතර, පක්ෂයේ කෘත්‍යාධිකාරී කමිටුවේ යෝජනා සම්මතයක් අනුව, පක්ෂයේ අරමුදල් එවැනි දේපල අත් කර ගැනීමක් සඳහා යෙදවීම ද, නීත්‍යානුකූල වන්නේය.

බැංකු ගිණුම්

15.2 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂය වෙනුවෙන් බැංකු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම කළ හැකි අතර පක්ෂය විසින් පවත්වාගෙන යනු ලබන ඕනෑම බැංකු ගිණුමක් පාලනය සඳහා නිල අත්සන් තබන්නෙකු වශයෙන් සාමාජිකයෙකු පත් කිරීම කළ හැක්කේය.

15.3 පක්ෂය වෙනුවෙන් බැංකු අයිරාවක් මගින් සහ බැංකු මගින් සපයන වෙනත් ඕනෑම පහසුකමක් ඇතුලත්ව බැංකු මගින් ණය ලබා ගැනීම අනුමත කිරීම සඳහා බලය ඇත.

ඔප්පු

15.4 එවැනි දේපළ පක්ෂය වෙත පවරා ගැනීමේ ඔප්පු හෝ වෙනත් ලේඛන තත් කාලයේ ධූරය දරන පහත දැක්වෙන නිලධරයන්ගේ නාමට, පක්ෂය වෙනුවෙන් ලියා අත්සන් කරනු ලැබිය යුතු ය.

(අ) සභාපති

(ආ) මහ ලේකම් සහ

(ඇ) මහා භාණ්ඩාගාරික

තව ද ඔවුන් එම දේපල පක්ෂය වෙනුවෙන් දරන අතර කිසිදු පුද්ගලයෙකුට එම දේපල සම්බන්ධ පුද්ගලික හිමිකමක් නොමැත්තේය.

15.5 ඉහත සඳහන් පරිදි එකී නිලධරයන්ගේ නමට එවැනි ඔප්පුවක් හෝ ඔප්පු හෝ වෙනත් ලේඛන ලියා අත්සන් කිරීමේ දී ඒ දේපලෙහි අයිතිය පක්ෂයේ භාරයක් වශයෙන් එකී නිලධරයන් වෙත පැවරෙන අතර, ඒ නිලධරයන් විසින් ඒ දේපල පක්ෂය සඳහා භාරයක් වශයෙන් දැරිය යුතුය.

දේපල අයිතිය

15.6 එකී දේපල අයිතිය එවැනි තැනැත්තෙකු හෝ තැනැත්තන් වෙත පැවරීම සඳහා භාර ආඥා පනතේ 113 වන වගන්තිය ප්‍රකාර අවශ්‍ය වන පැවරීමකින්, පැවරුම් නියමයකින් හෝ වෙනත් සහතිකයකින් තොරව, එකී ධූරය තත් කාලයෙහි දරන්නා වූ හෝ ඒ ධූරයෙහි තත් කාලයෙහි වැඩ බලන්නා වූ හෝ ඒ ධූරයෙහි තත් කාලයෙහි ඉටු කරන්නා වූ තැනැත්තා හෝ තැනැත්තන් වෙත ඒ දේපල පිළිබඳ අයිතිය කලින් කල පැවරේ.

දේපල ගැන ක්‍රියා කිරීම

15.7 විකිණීමෙන්, උකස් කිරීමෙන්, බදු දීමෙන් හෝ වෙනත් ආකාරයකින් එකී දේපළ පිළිබඳව කටයුතු කිරීම සඳහා ඒ නිලධරයන්ට බලය පවරමින් තත් කාර්යය සඳහා පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාවක් අනුව ඒ නිලධරයන් විසින් එම දේපල සම්බන්ධයෙන් එසේ කටයුතු කිරීම නීත්‍යානුකූල වන අතර, එම බලය ඔවුන් වෙත මෙයින් පවරා දෙනු ලැබේ.

## 16 වන පරිච්ඡේදය

## 16 වන ව්‍යවස්ථාව

## සාමාන්‍ය සංක්‍රාන්තික විධිවිධාන

හදිසි අවස්ථා

16.1 මේ වගන්තිවල ඇති යම් වරදක් හෝ ඇතුලත් නොවූ යම් කරුණක් සම්බන්ධයෙන් හෝ යම් වගන්තියක අර්ථකථනයෙහි නිවැරදිතාවය සම්බන්ධයෙන් සැකයක් ඇති විට, කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණය හෝ පක්ෂයේ නායකයාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.2 පක්ෂයේ සම්මේලන, ජාතික විධායක සභාව, කෘත්‍යාධිකාරී මණ්ඩලය, උපදේශක මණ්ඩලය, විනය මණ්ඩලය සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පත් කරනු ලබන අනෙකුත් කමිටු හා අනු කමිටු, පළාත් / දිස්ත්‍රික් කමිටු, කොට්ඨාශ බල මණ්ඩල, යොවුන් හා වනිතා පෙරමුණු, ශාඛා සංවිධාන හෝ අනුබද්ධ සංවිධාන විසින් යම් තීරණයක් ගැනීමේ දී හෝ ක්‍රියාවක් සිදු කිරීමේ දී එම ආයතනයේ යම්කිසි පුරප්පාඩුවක් හෝ වරදක් සිදු නොවූවා සේ සලකා එම ආයතන විසින් ගනු ලබන තීරණ නීතිමය ලෙස වලංගු සේ සැළකිය යුතු ය.

ව්‍යවස්ථාව අර්ථකථනය

16.3 මෙම ව්‍යවස්ථාවේ පවතින යම්කිසි වරදක් නිවැරදි කිරීම සඳහා ද ව්‍යවස්ථාවේ සඳහන් නොවන කාරණයක් සම්බන්ධව මෙම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කරමින් අවශ්‍ය විධානයන් නිකුත් කොට ඒවා ක්‍රියාත්මක කිරීමට ද පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

16.4 ව්‍යවස්ථාවේ සඳහන් පදාර්ථයන් සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ව්‍යවස්ථාවෙහි:

''සභාපති'' යන්නෙන් පක්ෂයේ සභාපති අදහස් වන අතර, පක්ෂයේ යම් වැඩ බලන සභාපතිවරයෙකු ද ඊට ඇතුළත් වේ.

''මහ ලේකම්'' යන්නෙන් පක්ෂයේ නායකයා විසින් පත් කරනු ලබන පක්ෂයේ මහ ලේකම් අදහස් වන අතර, පක්ෂයේ යම් වැඩ බලන මහ ලේකම්වරයෙකු ද ඊට ඇතුළත් වේ.

''මහා භාණ්ඩාගාරික'' යන්නෙන් පක්ෂයේ නායකයා විසින් පත් කරනු ලබන පක්ෂයේ මහා භාණ්ඩාගාරික අදහස් වන අතර, පක්ෂයේ යම් වැඩ බලන මහා භාණ්ඩාගාරිකවරයෙකු ද ඊට ඇතුළත් වේ.

සම්මේලන කැඳවීමට නොහැකි වීම

16.5 පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් ස්වකීය පරම අභිමතය අනුව තීරණය කරන ලද බලාපොරොත්තු නොවූ හේතූන් හෝ පක්ෂයේ පාලනයෙන් තොර වූ කරුණු උඩ ව්‍යවස්ථාවේ ප්‍රකාර වාර්ෂික සම්මේලනය හෝ ජාතික විධායක සභා රැස්වීම කැඳවා පැවැත්වීමට නොහැකි වීම මත මෙම ව්‍යවස්ථාව යටතේ කරන ලද කිසිම ක්‍රියාවක් හෝ කරුණක් හෝ දෙයක් බල රහිත හෝ අගතිදායක නොවන අතර, එබැවින් එකී සියලුම ක්‍රියාවන්, කරුණු හෝ දෑ වලංගු සහ පූර්ණ වශයෙන් බල සහිත සහ ක්‍රියාත්මක වශයෙන් පිළිගැනෙන අතර, තත්කාලයෙහි නිල දරන පක්ෂ නිළධාරීන් එවැනි සම්මෙලනයකින් හෝ රැස්වීමක් පවත්වන තෙක් එකී නිලතල දරන්නාහ. පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ

අදහස අනුව එකී හේතුන් පහව ගිය වහාම පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් අදාළ වාර්ෂික සම්මේලනය සහ හෝ ජාතික විධායක කමිටුවේ රැස්වීම් කැඳවිය යුතු ය.

16.6 මෙම ව්‍යවස්ථා පැනවීමෙන් පසුව මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව නව රීති ස්ථාවර නියෝග සහ ආචාර ධර්ම පද්ධතියක් සම්මත කර ඇතුළත් කරන තුරු තත්කාලයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් දැනට පනවා ඇති රීති, ස්ථාවර නියෝග සහ ආචාර ධර්ම පද්ධතිය බලාත්මකව පවතින්නේය.

16.7 මෙම ව්‍යවස්ථාව සම්මත කර ගනු ලබන අවස්ථාව වන විට බල මණ්ඩලය, ශාඛා සමිති, යොවුන් හා ලක් වනිතා පෙරමුණු සහ ඒවායේ ශාඛා විතය මණ්ඩලය සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පත් කරන ලද අනෙකුත් කමිටු සහ අනු කමිටු දිස්ත්‍රික් සහ කොට්ඨාශ සංවිධායකයින්, කළමණාකරුවන් සහ අනෙකුත් ක්‍රියාකාරීන්, මෙම ව්‍යවස්ථාව යටතේ නව පත් කිරීම් සිදු කරන තෙක් එකී තනතුරු දරන නිලධාරීන් වශයෙන් තවදුරටත් සිය බලතල සහ වගකීම් දරමින් කටයුතු කළ යුත්තේය.

16.8 මෙම ව්‍යවස්ථා පක්ෂ සම්මේලනයේ දී සම්මත වීමට වහා පූර්වයෙන් පක්ෂ නායකයා, සභාපති, මහ ලේකම්, මහා භාණ්ඩාගාරික ධූර දරන්නන් මෙම ව්‍යවස්ථාව සම්මත වීමෙන් පසුව නව නිලධාරීන් එම ධූර සඳහා පත් කරන තුරු හා ක්‍රියාකාරී වන තුරු එම ධූර දැරීම නීත්‍යානුකූල වන්නේය.

16.9 ඉහත 8.3 ව්‍යවස්ථාවේ පූර්වයෙන් දක්වා ඇති අන්තර්කාලීන කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයින් මෙම ව්‍යවස්ථා අනුකූලව නව කෘත්‍යාධිකාරී මණ්ඩලය පිහිටුවා ක්‍රියාත්මක වන තුරු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන් ලෙස අඛණ්ඩව ධුර දැරිය යුත්තේය.

16.10 මෙම ව්‍යවස්ථාව පක්ෂ සම්මේලනයේ දී සම්මත වීමට පෙර පැවති ජාතික විධායක සභාව මෙම ව්‍යවස්ථාවේ අනුකූලව ජාතික විධායක සභාව පිහිටුවා ක්‍රියාත්මක වන තෙක් ක්‍රියාත්මක විය යුත්තේය.

1611 මෙම ව්‍යවස්ථා සම්මත වන දිනය වන විට ජාතික විධායක සභාව විසින් පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත පවරා ඇති සියලු ම බලතල, ක්‍රියාකාරකම් සහ වගකීම් ජාතික විධායක සභාව විසින් ඉවත් කරන ගන්නා තෙක් වලංගුව හෝ බලාත්මකව ක්‍රියාත්මක විය යුත්තේය.

16.12 මෙම ව්‍යවස්ථා පක්ෂ සම්මේලනය මගින් සම්මත කිරීමට පෙර ආරම්භ කළ විනය ක්‍රියාමාර්ගයන් සියල්ල නීත්‍යානුකූල වන අතර මෙම ව්‍යවස්ථාව සම්මත කිරීමෙන් පසුව එකී සියලුම විනය ක්‍රියාමාර්ගයන් අවසන් නිගමනයට එළඹෙන තෙක් මෙම ව්‍යවස්ථාවෙහි ඇති ප්‍රතිපාදනවලට අනුකූලවව පවත්වාගෙන යා යුත්තේය.

16.13 පක්ෂයේ සම්මේලනය විසින් මෙහි සඳහන් සංශෝධනයන් අනුමත කරන අවස්ථාවට පූර්වයෙන් පැවති පක්ෂ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් යටතේ පක්ෂයේ සියලුම

සංවිධානයන් සහ අනුබද්ධ සංවිධාන විසින් ගන්නා ලද තීරණ සහ සිදු කරන ලද සියලුම ක්‍රියාකාරකම් මෙම ව්‍යවස්ථාවේ ඇතුළත් ප්‍රතිපාදන යටතේ ගන්නා ලද තීරණ වශයෙන් සහ සිදු කරන ලද සියලුම ක්‍රියාවන් මෙම ව්‍යවස්ථාව යටතේ සිදු කරන ලද ලෙස සළකා නීත්‍යානුකූල සහ වලංගු ලෙස සැළකිය යුත්තේ ය. තව ද, පක්ෂයේ සියලුම සංවිධාන සහ අනුබද්ධිත සංවිධාන ද විනය පරීක්ෂණ ක්‍රියා පටිපාටින් සහ තීරණ ඇත්නම් ඊට යටත්ව පාක්ෂිකයන්ගේ පක්ෂ සාමාජිකත්වය සම්බන්ධව පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය මෙහි සඳහන් ප්‍රතිපාදන යටතේ වෙනත් සුදුසු තීරණයක් ගන්නා තෙක් සහ / හෝ ප්‍රතිසංවිධාන කටයුතු සිදු කරන තෙක් ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක විය යුත්තේ ය.